**<u>විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ</u>**

**<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ</u>**

**<u>ග්‍රහලෝකාගාර ශිල්පී/ සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.</u>**

01. සම්බන්ධ වන ආයතන

| | | |
|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය | යොමු අංකය :ග්‍රහ.සේ.ව්‍ය හා බඳවා ගැනීම් | දිනය : 2012.08.07 |
| 1.2 අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ | යොමු අංකය : ST/2/8/ග්‍රහ/17 | දිනය :2012.08.07 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය :DMS/C1/07/10 | දිනය :2011.09.07 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය :EST/2/RECRU/02/0257 | දිනය :2012.06.20 |
| 1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය :NCC/6/7/106/SR | දිනය :2012.06.08 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | යොමු අංකය :PSC/EST/6/1/7/2/2012 | දිනය:2012.11.22 |

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්.

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර - (තාක්ෂණ )

3.2 ශ්‍රේණිය : III, II, හා I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳව පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුමාන (Multi-Functional) ස්වරූපයේ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 3 - 2016

5.2 වැටුප් පරිමාණය : රු.31,040 – 10 X 445 - 11 X 660 - 10 X 730 – 10 X 750 - 57,550/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 31,040.00 |
| II | පියවර 12 | 36,150.00 |
| I | පියවර 23 | 43,480.00 |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්,

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| 01. සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී | 01 | 01.ග්‍රහලෝකාගාරයේ දර්ශන පවත්වන වේලාවන් පැය භාගයටකට පමණ පෙර දර්ශන සදහා ප්‍රක්ෂේපක උපකරණ හා අනෙකුත් උපකරණ සකස් කර දර්ශනය සදහා සුදුසු බව කාර්යාලයට වාර්තා කිරීම.<br>02.දර්ශන පැවැත්වෙන අවස්ථාවල දී ප්‍රක්ෂේපක උපකරණ හා අනෙකුත් උපකරණ ක්‍රියාකරවීම හා දර්ශන පැවැත්වෙන අවස්ථාවන් හිදී ඇති වන හදිසි දෝෂ නිවැරදි කිරීම.<br>03.ග්‍රහලෝකාගාරය සතු ප්‍රක්ෂේපක උපකරණ හා ඒ හා සම්බන්ධ සියලු උපකරණ වල (ශ්‍රව්‍ය, දෘශ්‍ය උපකරණ සියල්ල ඇතුළුව දෝෂ ඇත්නම් ඒ බව ආයතන ප්‍රධානියාට සහ ග්‍රහලෝකාගාර ශිල්පීන්ට දන්වා අවම කාලයක් තුලදී නිවැරදි කිරීම හා අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීම.)<br>04.දර්ශන පැවැත්වීමට පැය ½ පමණ පෙර ද, දර්ශනය අවසන්වී උපකරණ ක්‍රියාවිරහිත කරන තෙක් ද, සේවය ග්‍රහලෝකාගාර දර්ශන කුටිය තුලට අනිවාර්යයෙන්ම ලබාදීම.<br>05.ග්‍රහලෝකගරයෙහි අනෙකුත් කටයුතු සදහා සහය ලබා දීම. |
| 02. ග්‍රහලෝකාගාර ශිල්පී | 01 | 01.ග්‍රහලෝකාගාරය සතු සියලු යාන්ත්‍රික හා විදුලි උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.<br>02.රාජකාරි දිනවල දර්ශන පවත්වන වේලාවන්ට පැය භාගයකට පමණ පෙර දර්ශනය පැවත්වීමට අදාළ උපකරණ පරික්ෂා කර දර්ශනය සදහා ප්‍රක්ෂේපක උපකරණ හා අනෙකුත් උපකරණ සුදුසු බව ආයතනය ප්‍රධානියාට වාර්තා කිරීම.<br>03.දර්ශන පැවත්වෙන අවස්ථාවලදී ප්‍රක්ෂේපක උපකරණ හා අනෙකුත් උපකරණ ක්‍රියාකරවීම හා දර්ශන පවත්වන අවස්ත්වන් හිදී ඇතිවෙන හදිසි දෝෂ නිවැරදි කිරීම.<br>04.ග්‍රහලෝකාගාරය සතු ප්‍රක්ෂේපක උපකරණ හා සම්බන්ධ සියලු උපකරණ ඒවායේ නිවැරදි ක්‍රියාකාරීත්වය ගැන සම්පූර්ණ වගකීම දැරීම හා ඒවායේ දෝෂ ඇති වූ විට ආයතන ප්‍රධානියාට දන්වා අවම කාලයක් තුලදී නිවැරදි කිරීම හා අලුත්වැඩියා කිරීම.<br>05.අලුත්වැඩියා සඳහා අවශ්‍ය වන අමතර කොටස් හා අනෙකුත් ද්‍රව්‍යයන් වාර්ෂික අවශ්‍යතවයන් අනුව ඇස්තමේන්තු ඉදිරිපත් කරමින් එම ද්‍රව්‍යයන් ලබා ගෙන තැන්පත් කර තැබීමට කටයුතු කිරීම.<br>06.බරපතල අලුත්වැඩියාවකට පෙර අවශ්‍ය වන අමතර කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය හා අලුත්වැඩියාට ගතවන කාලය ඇස්තමේන්තු කර කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම.<br>07.දර්ශන පැවැත්වීමට පැය ½ පමණ පෙර ද, දර්ශනය අවසන්වී උපකරණ ක්‍රියාවිරහිත කර තෙක් ද, සේවය ග්‍රහලෝකාගාර දර්ශන කුටිය තුලට අනිවාර්යයෙන්ම ලබාදීම.<br>08.නඩත්තු හා අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය වන අමතර කොටස් හා අවශ්‍ය වන ද්‍රව්‍ය ලිඛිතව භාරගැනීම හා ඉවත්කරනු ලබන පරණ කොටස් හා වෙනත් දෑ ලිඛිතව භාරදීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී 01

ග්‍රහලෝකාගාර ශිල්පී 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශත |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන : 1. III, II, I යන ශ්‍රේණියන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරග විභාගයකින් සම්පූර්ණ කෙරේ.

2. සීමිත තරඟ විභාගයකින් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුල නොසිටි නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරාගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කර ගත හැකිය.

3. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සහකාර ගෘහලෝකාගාර ශිල්පී III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් : (අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06)කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර ) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ

විෂයන් 03 කින් එකවර සමත්ව තිබීම.)

7.2.2.2. වෘත්තිය සුදුසුකම් : 1. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

2. මොරටුව විශ්ව විද්‍යාල හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව,

හෝ

3. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

4. උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන (1) කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම .

6. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන

ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3. පළපුරුද්ද : විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

7.2.2.4. කායික සුදුසුකම් තනතුරේ : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්

රාජකරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5.වෙනත් : (I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(II) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(III) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3. වයස :

7.2.3.1. අවම වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.2.3.2. උපරිම වයස් සීමාව : අවුරුදු 30ට නොවැඩි.

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ.

7.2.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරික්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>2. අතිරේක වෘත්තිය සුදුසුකම්<br>3. පළපුරුද්ද<br>4. භාෂා හැකියාව<br>5. පරිගණක දැනුම<br>6. සම්මුඛ පරීක්ෂණයේදී පිලිබිඹු කරන කුසලතාවය | 10<br>25<br>20<br>20<br>20<br>05 | අදාළ නොවේ |
| | 100 | |

සටහන : ලිඛිත විභාගයෙන් සමත් ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් සහ අමාත්‍යාංශ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා අනුව බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වේ.

09. භාෂා ප්‍රවීණතා : ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වේ.
10. ශ්‍රේණි උසස් කිරීම : ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වේ.

සටහන : 1 වන හා 2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා අදාළ වන විෂය නිර්දේශයන් ඇමුණුම 01 හා ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

11. තනතුරු වලට පත් කිරීම : සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ග්‍රහලෝකාගාර ශිල්පී තනතුරට බඳවා ගනු ලබන අතර ජ්‍යෙෂ්ඨතාවය හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ග්‍රහලෝකාගාර ශිල්පී තනතුරට පත් කරනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටිය රීතිවල දැක්වෙන පොදු කොන්දේසි අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරකට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රිය සේවා කාලයඳසඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම : ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවේ විධි විධාන අනුව වේ.

15. ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන බැවින් මෙම නිළධර ගණයට පැවරෙන් කාර්යයන් අතුරින් ඕනෑම කාර්ය භාරයක් ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටිය විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

---

සකස් කලේ : අත්සන : .............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම :-...............................................
තනතුර :-.........................................

දිනය :-.............................................

පරීක්ෂා කලේ : අත්සන : .............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම :-...............................................
තනතුර :-.........................................

දිනය :-.............................................

---

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :-.............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම :-...............................................

තනතුර :-.........................................

දිනය :-.............................................

නිල මුද්‍රාව :-.............................................

ඇමුණුම 01

**1 වන දෙපාර්තමේන්තු පරීක්ෂණය**

1. විභාගය පිළිබඳ විස්තර :

| **ප්‍රශ්න පත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධාරයා : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

4. විභාගය සඳහා වන නිර්දේශය

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| • විෂයානුබද්ධ දැනුම | I. විවධ වර්ග වල ප්‍රක්ෂේපණ යන්ත්‍ර වල ඇති විද්‍යුත් පරිපථ වල දෝෂ හඳුනාගැනීම හා නිවැරදි කිරීම.<br>II. ප්‍රක්ෂේපණ යන්ත්‍ර වල යාන්ත්‍රික කොටස්වල ඇති විය හැකි දෝෂ හඳුනාගැනීම හා නිවැරදි කිරීම.<br>III. ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධති ක්‍රියා කිරීම පිලිබඳ හැකියාව.<br>IV. විවධ වර්ගවල දුරේක්ෂ නිවැරදිව පරිහරණය කිරීම පිලිබඳ හැකියාව.<br>V. නිශ්චල ඡායාරූපකරණය පිළිබඳ දැනුම.<br>VI. වීඩියෝ උපකරණ නඩත්තුව. |

සකස් කලේ

අත්සන : .......................................

නම : .......................................

තනතුර : .......................................

දිනය : ........................................

පරික්ෂා කලේ

අත්සන : .......................................

නම : ........................................

තනතුර : ........................................

දිනය : ........................................

අත්සන : ........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී )

නම : ........................................

තනතුර : ........................................

**ඇමුණුම 02**

**2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණය**

1. විභාගය පිළිබඳ විස්තරය

| **ප්‍රශ්න පත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| තාක්ෂණික විෂය | පැය 02 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධාරයා : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

4. විභාගය සඳහා වන නිර්දේශය

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| • තාක්ෂණික විෂය | I. දුරේක්ෂ වල භාවිතා කෙරෙන විද්‍යුත් හා යාන්ත්‍රික උපාංග පිළිබඳ දැනුම හා ඒවායේ ඇති විය හැකි දෝෂ නිවැරදි කිරීම පිළිබඳ දැනුම .<br>II. සියලුම ප්‍රක්ෂේපණ යන්ත්‍ර සමඟ විද්‍යුත් යාන්ත්‍රික කොටස් දිගු කාලීන පැවැත්ම සඳහා නඩත්තු හා සේවා කටයුතු කලයුතු දැනුම තිබීම හා ඒ සඳහා පූර්ව ඇස්තමේන්තු සකස් කිරීම.<br>III. චලන රූප, නිශ්චල රූප ප්‍රක්ෂේපණ ක්‍රම පිළිබඳ දැනුම.<br>IV. ග්‍රහලෝකාගාරයේ සියළුම ප්‍රක්ෂේපණ උපකරණ මඟින් ප්‍රදර්ශනය කළ හැකි සියළුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමේ හැකියාව හා රාත්‍රී අහසේ තාරකා රූප හඳුනා ගැනීමේ හැකියාව.<br>V. දර්ශන සඳහා භාවිතා කරනු ලබන අනෙකුත් උපකරණ ක්‍රියාත්මක කිරීමේ හැකියාව. |

සකස් කලේ

අත්සන : .......................................

නම : ........................................

තනතුර : ........................................

දිනය : ........................................

පරීක්ෂා කලේ

අත්සන : .......................................

නම : ........................................

තනතුර : ........................................

දිනය : ........................................

අත්සන : ........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී )

නම : ........................................

තනතුර :		......................................

දිනය :		......................................

නිල මුද්‍රාව :